මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.
2021.06. 08

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

සි.ඩී.වික්‍රමරත්න මහතා
පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**<u>පොලිස් භාරයේ සිටියදී වධහිංසාවට ලක්වීම් හා මියයාම් සම්බන්ධවයි.</u>**

2021.06.03 දින චන්දන විදුෂන් යන අය මඩකලපුව මූලස්ථාන පොලිස් භාරයේ සිටියදී හා 2021.06.06 දින අලිඛාන් යන අය පානදුර උතුර පොලිස් භාරයේ සිටියදී මිය ගොස් ඇති බවට මාධ්‍ය විසින් වාර්තා කරන ලද සිදුවීම් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ දැඩි අවධානයට ලක් වූ අතර මෙම සිදුවීම පිළිබඳව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වගන්ති ප්‍රකාරව විමර්ශනයක් ආරම්භ කර ඇත.

මෙහිදී අදාල පුද්ගලයින් දෙදෙනා පොලිස් භාරයේ සිටියදී මිය යාම මෙන්ම අත්අඩංගුවේදී කෲර අමානුෂික හා අවමන් සහගත සැලකිල්ලකට ලක්වී ඇති බවටද වැඩිදුරටත් කරුණු අණාවරණය වී ඇත.

ඒ අනුව පසුගිය දින කිහිපයක් තුල පොලිස් භාරයේ සිටින පුද්ගලයින්ගේ ආරක්ෂාව පිළිබඳව ගැටලු පැන නැගී ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 13(4) ව්‍යවස්ථාවන් හා ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ලබා දී ඇති නඩු තීන්දු මෙන්ම 2021.05.17 හා 2020.10.21 දිනැතිව ඔබ වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් යොමු කරනු ලැබූ ලිපි පිළිබඳව නැවතත් ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමු

පොලිස් භාරයේ සිටින පුද්ගලයන්ගේ ආරක්ෂාව පිළිබඳව දිගින් දිගටම මෙවැනි සිදුවීම් වාර්තා වීම පුරවැසියන්ගේ පුද්ගල නිදහසට තර්ජනයක් මෙන්ම රටතුල මහජන ආරක්ෂාවේ බිඳවැටීමක් ද නිරීක්ෂණය වන බව සඳහන් කරමු.

එබැවින් ප්‍රශස්ථ ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයක් තුල මෙවැනි සිදුවීම් දිගින් දිගටම වාර්තාවීම නීතියේ ආධිපත්‍යය කෙරෙහි ජනතාවගේ පවතින විශ්වාසය බිඳ වැටීමක්ද පෙන්නුම් කරන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අදහස වේ.

එබැවින් උක්ත ලිපි මගින් දැන්වූ වාර්තා වලට අමතරව මෙවැනි තත්වයන් නැවත සිදුවීම වැලැක්වීම සඳහා ඔබ විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව 2021.06.13 දිනට පෙර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කිරීමට පියවර ගැනීමට මෙයින් ඔබට දැනුම් දෙමු.

මෙම දැන්වීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල ප්‍රකාරව බව සලකන්න.

ආචාර්ය ජගත් බාලසූරිය
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ආචාර්ය ජගත් බාලසූරිය
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය